(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 95.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 සැප්තැම්බර් 22 බදාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

91/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2019 වර්ෂය තුළ වාර්තා වූ රිය අනතුරු සංඛ්‍යාව සහ එම රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 සහ 2018 වර්ෂවලට සාපේක්ෂව, 2019 වර්ෂය තුළදී සිදු වූ රිය අනතුරු සංඛ්‍යාව සහ එම රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණ සංඛ්‍යාවකින් ඉහළ ගොස් තිබේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

294/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

316/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ සිට කොලොන්නාව නිමාව දක්වා බනිජ තෙල් ගෙන යනු ලබන නළ පද්ධතිය ඉතා පැරණි බවත්;

(ii) ඒ හේතුවෙන් විශාල ලෙස වංචා සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම නළ පද්ධතිය නවීකරණය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

712/2020

ගරු මයන්ත දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වන අලි සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම සංගණනය සිදු කරන ලද වර්ෂය කවරේද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ සිටින වන අලින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි-මිනිස් ගැටුම් හේතුවෙන් වාර්ෂිකව මිය යන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(ii) වන අලින් රැක බලා ගැනීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) වන අලින් ගම් වැදීම වැළැක්වීම සඳහා අලි-වැට ඉදිකිරීම සාර්ථක ක්‍රියාමාර්ගයක් වන්නේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප ක්‍රමයක් හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

767/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වගා කළ හැකි බෝග වර්ග ගණනාවක් ආනයනය කරනු ලබන බව එතුමා පිළිගන්නේද;

(ii) සහල්, බඩඉරිඟු, මුං, කව්පි, ඉඟුරු සහ කහ ආදියෙහි වාර්ෂික අවශ්‍යතාවය මේ වනවිට හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් බෝග ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

778/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා අහත්තිමුරිප්පු අලක්කට්ටු ගම්මානයේ පිහිටා ඇති ඉඩම වෙන් කර ඒ සඳහා වන බලපත්‍ර, එවකට අග්‍රාමාත්‍යවරයා විසින් අදාළ පවුල්වලට 2014.10.12 වන දින කිළිනොච්චියේදී ලබා දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක NP/28/04/03/169 හා 2013.07.02 දිනැති ලිපියට අනුව, සකස් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් අතරින් මේ වනවිට බලපත්‍ර ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් බලපත්‍රලාභීන් අතරින් මේ වනවිට ඉඩම් ලැබී ඇති බලපත්‍රලාභීන් සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනතෙක් ඉඩම් ලැබී නොමැති බලපත්‍රලාභීන්ට ඉඩම් ලබා දෙන දිනය කවරේද;

(vi) ඉඩම් බලපත්‍ර ලබා දීමේදී ප්‍රමාදයන් ඇති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

932/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිරිසිදු පානීය ජලය ලබා නොදීම හේතුවෙන් වවුනියාව දිස්ත්‍රික්කයේ ජනතාව වකුගඩු රෝගයෙන් පීඩා විඳින බවත්;

(ii) වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, ගම් 14කින් සමන්විත ආසික්කුලම් ග්‍රාම නිලධාරි වසමේ ජීවත්වන පවුල් 2048ක් පිරිසිදු පානීය ජලය නොමැති වීම හේතුවෙන් පීඩා විඳින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පිරිසිදු පානීය ජල පහසුකම් සහිත වවුනියාව දිස්ත්‍රික්කයේ ජීවත් වන පවුල් සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) වවුනියාව දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ප්‍රදේශ සඳහා ජල පහසුකම් ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

(iii) පාෂාණ ස්ථර සහිත භූමියකින් සමන්විත ආසික්කුලම් ග්‍රාම නිලධාරි කොට්ඨාසය සඳහා කඩිනමින් පිරිසිදු පානීය ජලය ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1366/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය'' නමින් ව්‍යාපෘතියක් පවතින බවත්;

(ii) එම ව්‍යාපෘතිය යටතේ නුගේගොඩ, එදිරිසිංහ පාරේ සිට කට්ටිය හන්දිය දක්වා වූ කොටසේ වැඩ අවසන් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කොටසේ වැඩ මේ වනතෙක් අවසන් නොකිරීමට හේතු කවරේද;

(ii) එම කොටසේ වැඩ අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1404/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පවතින දේශීය වී ප්‍රභේදවල නම්;

(ii) ශ්‍රී ලංකාවට පමණක් ආවේනික වූ දේශීය වී ප්‍රභේදවල නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැරණි වී ප්‍රභේද වර්ග වගා කිරීම සඳහා පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බව දන්නේද;

(ii) පැරණි වී ප්‍රභේද වර්ග සංරක්ෂණය කිරීමට සහ වගා කිරීමට ගෙන ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වනවිට ශ්‍රී ලංකාවේ වකුගඩු හා පිළිකා රෝග බහුලව පවතින බවත් එතුමා දන්නෙහිද?

(ඈ) ජාන විකෘති කළ නිෂ්පාදිත, ශ්‍රී ලංකාවට ආවේනික නොවූ වී සහ බීජ වර්ගවලින් නිෂ්පාදන කරන ලද ආහාර භාවිතා කිරීම ප්‍රධාන වශයෙන් මෙයට හේතු වී ඇති බව පර්යේෂණ මඟින් තහවුරු වී තිබේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1669/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉතාලියේ, මිලාන් නගරයේ පිහිටි කොන්සල් ජනරාල් කාර්යාලය සඳහා මේ වනවිට කොන්සල් ජනරාල්වරයෙකු පත් කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් මිලාන් නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් කොන්සල් ජනරාල් කාර්යාලය සඳහා කොන්සල් ජනරාල්වරයෙකු පත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2021 ඔක්තෝබර් 04 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 ඔක්තෝබර් 04 දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 ඔක්තෝබර් 04 සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— 2021 ඔක්තෝබර් 04 සඳුදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ වැඩකටයුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 35හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

5.

ගරු මනූෂ නානායක්කාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ඉන්දිරා පිළිකා භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියෝග,— (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වගන්තිය සමඟ කියවිය යුතු 22අ වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 19 දිනැති අංක 2241/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝග,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 20 දිනැති අංක 2228/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝග,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ පැවරුම් මිල නියෝග සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 මාර්තු 02 දිනැති අංක 2217/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝගය,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්ෂණය සහ සඑල සේවා නියම කරමින් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 ජූනි 29 දිනැති අංක 2234/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝගය,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්ෂණය සහ සඵල සේවා නියම කරමින් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 ජූනි 29 දිනැති අංක 2234/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 6(2) වන වගන්තිය යටතේ ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 මැයි 10 දිනැති අංක 2227/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඛනිජතෙල් සම්පත් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1].

*14.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඇ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

15.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---